අධ්‍යක්ෂ,
විභාග කොට්ඨාසය ගෙන්

අණදෙන නිලධාරීන් සහ
සියලුම කොට්ඨාසභාර නිලධාරීන් වෙත,
(ක්‍රියාකාරි සහ ක්‍රියාකාරි නොවන)
අංශ ප්‍රධානී, ආයතන (ඊයු) අංශය

18 MAY 2021

**ආධුනික උප පොලිස් පරීක්ෂක සහ ආධුනික පොලිස් කොස්තාපල් නිලධරයන්ගේ සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය.**
**(නීතිය විෂයය සහ පොලිස් නියෝග/ ප්‍රායෝගික පොලිස්විධි විෂයය)**

නියෝජ්‍ය පොලිස්පති (බඳවා ගැනීම්/ පුහුණු හා විභාග) තුමාගේ 2009.04.01 දිනැති ලිපි අංක DIG/T/Ex/OW/695/2009 යටතේ ආධුනික උ.පො.ප./ කා.උ.පො.ප. සහ ආධුනික පො.කො./ කා.පො.කො. නිලධරයන්ගේ සේවය ස්ථිර කිරීමේ 2021 දෙවන කාර්තු පරීක්ෂණය පැවැත්වීමට මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **සුදුසුකම්**

2021.06.30 දිනට මාස 33 ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ වන ආධුනික උ.පො.ප./ කා.උ.පො.ප., පො.කො./ කා.පො.කො. නිලධරයන් සහ දැනටමත් මෙම පරීක්ෂණය සඳහා පෙනී සිට අසමත් වූ නිලධරයන් මේ සඳහා සුදුසුකම් ලබයි.

ආධුනික පො.කො. රියදුරන් මේ සඳහා අයදුම් නොකල යුතුයි.

02. **විෂය පථය**

අයදුම්කරුවන්/ කාරියන් පහත සඳහන් විෂයයන් 02 යටතේ ප්‍රශ්ණ පත්‍ර 02 කට පෙනී සිටිය යුතුයි.

1. නීතිය විෂයය
2. පොලිස් නියෝග හා ප්‍රායෝගික පොලිස් විධි විෂයය

03. **විභාගය පැවැත්වීම.**

විභාග කොට්ඨාසය මගින් නම් කරන ස්ථානයකදී හෝ ස්ථාන කිහිපයකදී මෙම කාර්තු පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරනු ඇත.

04. **අයදුම්පත්‍ර**

1. මෙම උපදෙස් පත්‍රිකාව සමඟ ඉදිරිපත් කෙරෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් විසින් A- 4 ප්‍රමාණයේ කොලයක සකස් කරගත් අයදුම්පතක අදාල විස්තර ඇතුලත් කර ඉදිරිපත් කල යුතුයි.

2. සේවා කඩවීම් ඇති නිලධරයන්ගේ සේවා ලේඛනයේ ඒ සම්බන්ධව සටහන් කර ඇති පිටුවේ සහතික කල පිටපතක් යාකර එවීමට කටයුතු කරන්න.

3. සෑම අයදුම්පත්‍රයක්ම කොට්ඨාස භාර නිලධාරියා මගින් ආවරණ ලිපියක් සහිතව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය හැකිය. (කොට්ඨාසයට අයත් සෑම අයදුම්පත්‍රයක්ම වරින්වර ඉදිරිපත් නොකර එක්වර ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.)

4. අපැහැදිලි, අසම්පූර්ණ හෝ කොට්ඨාසභාර නිලධාරියාගේ නිර්දේශය නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

→

05. **අයදුම්පත් භාර ගැනීම**

**2021.06.04** දිනට පෙර **අධ්‍යක්ෂ, පොලිස් විභාග කොට්ඨාසය, බිම් මහල, අංක 234, වොක්ෂෝල් වීදිය, කොළඹ 02** ලිපිනය වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි. මෙදිනෙන් පසු ලැබෙන අයදුම්පත්‍ර කුමන හේතුවක් නිසාවත් භාර නොගන්නා හෙයින් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව අවධාරණය කරමි. (ප්‍රමාදවී අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් විභාගය සඳහා පාසැල්වල ඉඩ පහසුකම් වෙන්කරවා ගැනීමේදී ගැටළු ඇතිවන බැවින් නියමිත දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.)

06. **විභාග ප්‍රවේශ පත්‍ර**

1. විභාග ප්‍රවේශපත්‍ර කොට්ඨාසභාර නිලධාරීන් මගින් අයදුම්කරුවන්ට භාරදීමට කටයුතු කරනු ඇත.

**සැලකිය යුතුයි.**

1. කොට්ඨාසය තුල සේවය ස්ථිර කිරීමේ කාර්තු පරීක්ෂණයට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ ලේඛණයක් තබාගෙන ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.
2. ආධුනික ලිපිගොනු පරීක්ෂාකර සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් නියමිත දිනට පෙර ඉදිරිපත් කරන්න.
3. සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වලකින්න.

කේ.කේ.කිංස්ලි ගුණසේකර,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
අධ්‍යක්ෂ,
පොලිස් විභාග කොට්ඨාසය.
2021.05.13

කේ.කේ. කිංස්ලි ගුණසේකර
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
අධ්‍යක්ෂ / පොලිස් විභාග කොට්ඨාසය
අංක. 234, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

**ස්ථානාධිපති,/ තොරතුරු කාමරය.**

කරුණාකර මෙම පණිවුඩය අදාල කොට්ඨාස වෙත කඩිනමින් බැහැර කිරීමට කටයුතු කරන්න.

17/05

පුද්ගලික සහකාර,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
පරිපාලන

**පුද්ගලික සහකාර**
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති**
**(පරිපාලන)**

01/05/17
13 20